# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 3 දරන විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 05 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 පෙබරවාරි මස 06 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 7.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2009 අංක 3 දරන විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 05 වන දින]

එල්. ඩී.—ඕ. (අයි. එන්. සී) 29/2007.

**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සියලු පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද; එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 3 දරන විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" හෝ "ආර්. එස්. පී. ඕ. ඒ." යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයන් වශයෙන් දැනට සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය"යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ද සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මිත්‍රශීලී බව සහ අන්‍යොන්‍ය සහයෝගිතාව වර්ධනය කිරීම;

(ආ) සාමාජිකයන්ට එකිනෙකා හමුවීමට අවස්ථාව ලබාදීම;

(ඇ) සාමාජිකයන්ගේ, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ සහ සාමාජිකයන් නොවූව ද විශ්‍රාමික පොලිස් නිලධාරීන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ සුභසාධනය වර්ධනය කිරීම ;

(ඈ) සාමාජිකයන්ගේ කලත්‍රයන්ට විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමයට (ආර්. එස්. පී. ඕ. ඒ.) අනුබද්ධ කාන්තාවන්ගේ කණ්ඩායමක් සංවිධානය කිරීම සඳහා ආධාර කිරීම;

(ඉ) හැකියාවක් ඇති අවස්ථාවන් හි දී සංගමයේ සාමාජිකයන්ට සහ වෙනත් විශ්‍රාමික පොලිස් නිලධාරීන්ට මූල්‍ය සහ වෙනත් ආධාර ලබාදීම;

(ඊ) සංගමයේ පරමාර්ථ වලට අනුකූල වන්නා වූ සේවාවක් රටට ලබාදීම ;

(උ) සාමාජිකයන්ට වෛද්‍යාධාර අවශ්‍ය වූ විට ඒවා ලබාදීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති දේශීය හෝ විදේශීය ආයතනයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;සහ

(එ) සාමාන්‍යයෙන් ඉහත කී අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම මේ පනතේ විධිවිධාන වලට සහ සංස්ථාවේ රීති වලට යටත්ව පරිපාලනය කිරීම, 6 වන වගන්තිය යටතේ සාදන ලද එකී රීති ප්‍රකාර පත් කර

ගනු ලබන විධායක කමිටුවක් මගින් සිදු කෙරේ. එකී විධායක කමිටුව, තෝරා පත්කර ගන්නා ලද සභාපතිවරයෙක්, උප සභාපතිවරුන් දෙදෙනෙක්, ලේකම්වරයෙක්, සහකාර ලේකම්වරයෙක්, භාණ්ඩාගාරිකවරයෙක්, සහකාර භාණ්ඩාගාරිකවරයෙක් සහ පස් දෙනකුට නොඅඩු කමිටු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත විය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ විධායක කමිටුවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්පත් කර ගැනීමට, කුළියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට ;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) යම් තැනැත්තකු හෝ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සමග ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින්

නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට;

(උ) දායක මුදල්, ආධාර, ප්‍රදානයන්, පරිත්‍යාග, දේශීය හෝ විදේශීය පුද්ගලයන්ගෙන් මුදල් වශයෙන් හෝ අන් අයුරකින් අපේක්ෂා කිරීමට, භාර ගැනීමට හා එකතු කර ගැනීමට ;

(ඌ) බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට හා වැසීමට සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ කිරීමට, සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන්ගේ ධුරය හැරයාම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ක්‍රියා කලාපය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ, බලතල, චර්යාව, කාර්යය සහ කර්තව්‍යයන් ද ඔවුන් පත් කිරීම, ඉල්ලා අස්වීම, ධුරය හැරයාම හා ධුරයෙන් පහ කිරීම ද ;

(ඈ) විධායක කමිටු රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ

රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීති(1) වන උප වගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන්, මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින් මතු ලැබෙන ත්‍යාග, අන්තිම කැමති පත්‍රයකින් කරනු ලබන පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි එක් රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියළු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර අයුරකින් උපලබ්ධි වුව ද මෙහි දක්වා ඇති පරිදි සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා

පමණක් යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළ වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිළ දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාග කිරීමක් හෝ අන්තිම කැමති පත්‍රයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු කර දෙනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් යම් ප්‍රකාශිත භාරයකට යටත්ව හෝ අන්‍යාකාරයකින් හෝ අත් කර ගැනීමට සහ දැරීමට මේ පනතේ කාර්යය සඳහා නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට, ප්‍රදානය කිරීමට, පවරා දීමට, ලබාදීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුත්තේ ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් පවත්වාගෙන යා යුතු ය.

(2) යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂපත්‍රයෙහි නිරවද්‍යතාවය සංස්ථාව විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්-

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයන් දරන්නා වූ ද තැනැත්තෙක් ;හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා

එකී ආයතන වලින් යම් ආයතනයක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

10. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු ණය සහ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය. සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

11. සංස්ථාව විසුරුවා හැරීමේ දි එහි සියලු ණය බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද යම් ආයතනයකට හෝ ආයතන වලට හෝ එකී දේපළ සංස්ථාවේ විධායක කමිටුවේ අභිමතය පරිදි පවරා දෙනු ලැබිය හැක්කේ ය. සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

12. සංස්ථාවේ සභාපති හා ලේකම්වරයා හෝ සංස්ථාවේ විධායක කමිටුව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය සංස්ථාගත මණ්ඩලයක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.